කථිකාචාර්ය (ආධුනික) පූජ්‍ය ඉලුක්කේවෙල ධම්මරතන හිමි,
බී.ඒ. (ගෞරව), බෞ.පා.වි.වි., එම්. ඒ. (කැලණිය),
බෞද්ධ දර්ශනය අධ්‍යයන අංශය,
බෞද්ධ අධ්‍යයන පීඨය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.

## සත්‍යය ප්‍රකාශ කිරීම පිළිබඳ බෞද්ධ ආකල්පය

බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනයෙහි අභිප්‍රාය සැමට හිතකාමී සමාජයක් බිහිකිරීමත් එමඟින් දෙලොව අභිවෘද්ධිය උදාකිරීමත් ය. ඒ බව වඩාත් හොඳින් පැහැදිලිවන සූත්‍ර දේශනාවකි පොට්ඨපාද සූත්‍රය. එහි දී පොට්ඨපාද පිරිවැජියා අරඹයා බුදුරජාණන් වහන්සේ වදාළේ තමන් වහන්සේ යමක් දේශනා කරන්නේ නම් එය ආත්මාර්ථ පරාර්ථ යන උභයාර්ථ සාධනය පිණිසත්, ලොව්තුරු දහම පිණිසත්, ශාසන බ්‍රහ්මචරියාව පිණිසත්, සසර කලකිරීම පිණිසත්, සසර නො ඇලීම පිණිසත්, සසර ගමන නවත්වනු පිණිසත්, සංසිඳීම පිණිසත්, මනාව දැනීම පිණිසත්, අවබෝධය පිණිසත්, නිවන පිණිසත් වන බව යි.[1]

උක්ත කරුණ සැළකිල්ලට ගැනීමේ දී අපගේ අවධානයට යොමු විය යුතු විශේෂ කරුණක් ඇත. එනම්, අප විසින් දකින ලද අසන ලද විඳින ලද හා දැනගන්නා ලද යමක් වේ නම්, එය ප්‍රකාශ නොකිරීම බොරුවක් යැයි සැළකිය හැකි ද යන්න යි. වෙනත් අයුරකින් සඳහන් කළහොත්, අප දකින, අසන, විඳින, දැන්ගන්නා සියල්ල ප්‍රකාශ කළයුතු ද යන්න යි. විශේෂයෙන් ම බොරුකීමෙන් වැළකීම නම් වූ ශික්ෂාපදය ආරක්ෂා කිරීමේ දී අප විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳ මූලික සූත්‍ර දේශනා මුල් කරගනිමින් මේ පිළිබඳව සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණ යි.

සමාජ ප්‍රභවය හා එහි විකාශය පිළිබඳව කරුණු දක්වන අග්ගඤ්ඤ සූත්‍රය සමග බොරුකීමේ ආරම්භය පරීක්ෂා කිරිමේ දී ඒ සඳහා දීර්ඝ ඉතිහාසයක් ඇති බව පැහැදිලි වෙයි. සමාජයේ මුලින් ම ව්‍යාප්ත වූ අයහපත් ක්‍රියාව සොරකම බවත්, පසුව ආයුධ ගැනීම, ප්‍රාණඝාතය ආදියත්, ඉන්පසු බොරුකීම ආරම්භ වූ බවත් එම සූත්‍රයෙහි සඳහන් වේ.[2]

චක්කවත්තිසීහනාද සූත්‍රයේ[3] දී මෙම ක්‍රියාවලිය පටිච්චසමුප්පන්නව සිදුවන අන්දම විස්තර කරයි. ඒ අනුව බොරු කීම සඳහා මූලික වශයෙන් හේතු සාධක වී ඇත්තේ මිනිසා තුළ ක්‍රමයෙන් වැඩී ආ තෘෂ්ණාව යි.[4] එය ද්වාදසාංග පටිච්චසමුප්පාදයේ අටවෙනි අංගය යි. එනම් වේදනාව නිසා තණ්හාව ඇති වෙයි යන්න යි. වේදනාව විවිධාකාර බව බුදුරජාණන් වහන්සේ විසින් බහුවේදනිය සූත්‍රයේ දී පෙන්වා දෙන ලදි.[5] ඒ අනුව සුඛ, දුක්ඛ, හෝ කුමන වේදනාවක් හෝ කරණ කොට ගෙන මිනිසා තණ්හාව උපදවයි. කුසගින්න,[6] දඬුවමින් නිදහස් වීම, කීර්ති නාමය ගෞරවය ආරක්ෂා කර ගැනීම ආදී නොයෙකුත් හේතුන් නිසා මිනිසා බොරු කීමට පෙළඹෙයි. එසේ ම මේ සඳහා ඉවහල් වූ තවත් සුවිශේෂී කරුණකි දිළිඳු බව. සමාජය තුළ ඇති නැති භේදය ඇති වීමත් සමග නැති අය ඇති අයගෙන් යැපීමට උත්සාහ ගත්ත ද සමාජය තුළ ඒ සඳහා ඉඩක් නැත. ඇති අයගේ උපදේශය වන්නේ තමා මෙන් දුක් මහන්සි වී දහදිය සලා මුදල් උපායා ගන්නා ලෙසයි.[7] මින් ගම්‍යවන තවත් කරුණක් වන්නේ සොරකම සඳහා අලස බව ද ඍජුව හේතුවන බවයි. ක්‍රමයෙන් වර්ධනය වූ සොරකමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජය තුළ අවි-ආයුධත් අවි-ආයුධ නිසා සත්වඝාතනයත් වේගයෙන් ව්‍යාප්ත විය. සොරකම් කරන, සතුන් මරන මිනිසුන් අසු වූ විට ඔවුනට දඬුවම් කිරීම

ඇරඹුණි. දඬුවමින් නිදහස් වීමේ අරමුණින් යුතු වූ මිනිසා බොරුකීමට හුරු පුරුදු විය. මේ අනුව වර්තමානයේ දී ද මිනිසා විසින් සිදු කරන බොහෝ අයහපත් ක්‍රියාවන්ගෙන් නිදහස් වී සමාජය ඉදිරියේ නිර්දෝෂී පුද්ගලයකු වීම සඳහා බොරුකීම නිරන්තරයෙන් ම උපයෝගී කරගන්නා බව ඉතා පැහැදිලි කරුණකි.

බොරුකීම විවිධ ආගමික හා දාර්ශනික ඉගැන්වීම් අතර ද අභියෝගයට ලක්වූවකි. විශේෂයෙන් ම බුදුරජාණන් වහන්සේගේ සමකාලීන ආගමික ශාස්තෘවරයෙකු වූ නිගන්ඨනාථපුත්තයන් වහන්සේගේ ඉගැන්වීම ද බොරුකීම වරදක් බව යි. එබැවින් උන්වහන්සේගේ ඉගැන්වීම් සමග ද මේ කරුණ සලකා බැලීම යුක්ති යුක්තය.

බුදුරජාණන් වහන්සේ නාලන්දාව සමීපයෙහි පිහිටි පාවාරික අඹවනයෙහි වැඩවසන අවස්ථාවෙහි අසිබන්ධකපුත්ත ගාමිණී නම් වූ නිගණ්ඨනාථපුත්තයන් වහන්සේගේ ශ්‍රාවකයෙකු බුදුරජාණන් වහන්සේ වෙත එළඹුණේ ය. මෙම අවස්ථාවේ දී බුදුරජාණන් වහන්සේ විසින් නිගන්ඨනාථපුත්තයන් සව්වන්ට කෙසේ දහම් දෙසති' දැ යි ඇසූ පැනයට පිළිතුරු වශයෙන් ඔහු මෙසේ ප්‍රකාශ කරයි. ''යම් කිසි කෙනෙක් පරපණ නසත් ද ඒ සියලු දෙන අපායට යන්නෝ ය. නිරයට යන්නෝ ය. .... මුසවා බෙණෙද් ද ඒ සියලු දෙන අපායට යන්නෝ ය. නිරයට යන්නෝ ය. යමක් බහුල කොට යමක් බහුල කොට වෙසේ නම් එයින් එයින් (නිරයට) පමුණුවනු ලැබේ ය''.[8]

මෙම පිළිතුර අරුත් රහිත හෙයින් එම සූත්‍රයේ දී ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා වෙයි. එහි දී බුදුරජාණන් වහන්සේ ප්‍රතිප්‍රශ්නයක් ඉදිපත් කරති. ''යම් පුද්ගලයෙක් නිරන්තරයෙන් සිදු කරන ක්‍රියාවක් කරණ කොට ගෙන අපායගාමී වන්නේ නම් කිසිවකුත් අපාගත නොවන බව ඔබට නො වැටහෙන්නේ ද? ... යම් පුද්ගලයෙක් බොරු කියන්නේ රැය දවාල අතුරින් කිසියම් මොහොතක දී පමණි. අනෙක් සෑම අවස්ථාවක දී ම ඔහු ඉන් වැළකී සිටියි. ඒ අනුව ඔහුගේ ජීවිත කාලයෙන් වැඩි කලක් වැය වන්නේ කුමක් සඳහා ද?''

මෙයට පිළිතුරු වශයෙන් ගාමිණී නම් වූ නිගණ්ඨනාථපුත්තයන් වහන්සේගේ ශ්‍රාවකයා ප්‍රකාශකරන්නේ ඔහු බොරු කියන්නේ ඉතා සුළු කාලයක් තුළ බවත් බොරු නො කියන කාලය ඉතා අධික බවත් ය. මේ පිළිතුරත් සමග බුදුරජාණන් වහන්සේ නිගන්ඨනාථපුත්තයන් වහන්සේගේ වචනයෙහි අර්ථය මෙසේ පැහැදිලි කරති. ''ගාමිණී යමෙක් යමක බහුල කොට වෙසේ නම් එයින් අපායට පමුණුවනු ලැබේ යැ යි ප්‍රකාශවන නිගන්ඨනාථපුත්තගේ වචනය පරිදි කිසිවෙක් අපායට, නිරයට යන්නේ නො වේ.''[9]

මෙවන් අදහස් ඇති ශාස්තෘවරුන් සරණ යෑම නිසා එම ශ්‍රාවකයෝ අපායගාමීහු ම වන බව බුදුරජාණන්වහන්සේ අවධාරණයෙන් යුතුව ප්‍රකාශ කරති. ''ගාමිණී මෙහි ඇතැම් ශාස්තෘවරයෙක් මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයිඃ යම්කිසි කෙනෙක් .... මුසවා බෙණෙද් ද ඒ සියලු දෙන අපායට යන්නෝ ය. නිරයට යන්නෝ ය. ගාමිණී ඒ ශාස්තෘවරයා කෙරෙහි ශ්‍රාවක තෙමේ ඉතා පැහැදුනේ වේ නම් ඔහුට මෙබඳු සිතෙක් වෙයි. ''මාගේ ශාස්තෘ තෙමේ යම්කිසි කෙනෙක් ... මුසා බණත් නම් ඒ සියලු දෙන අපායට යන්නෝ ය, නිරයට යන්නෝ ය'' යි මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙයි. මවිසින් ... මුසා බණන ලද්දේ වෙයි. මම ද අපායට යන්නෙම් නිරයට

යන්නෙම් වෙමියි යන දෘෂ්ටිය ඇති වෙයි. ගාමිණී ඒ වචනය අත් නොහැර ඒ සිත අත් නොහැර ඒ දෘෂ්ටිය අත් නොහැර බැහැර නොකොට ගෙනෙන ලද්දක් බහා තබන ලද්දේ යම් සේ නම් එමෙන් නිරයෙහි වේ.''[10]

උපාසකයෙකු විසින් ප්‍රහීණ කළ යුතු කරුණු පහක් ඇති බවත් ඒවා ප්‍රහීණ නො කිරීම හේතුවෙන් හෙතෙම දුශ්ශීලයෙකු වන බවත්, මරණින් මතු නිරයට යාමට එය හේතු වන බවත් වේර සූත්‍රයේ දක්වා ඇත. එසේ ප්‍රහීණ කළ යුතු කරුණු පහ නම් ප්‍රාණඝාතය, අදත්තාදනය, කාමමිත්‍යාචාරය, මුසාවාදය හා මත්පැන් පානය යි.[11] මේ අනුව, යමෙක් අසත්‍ය ප්‍රකාශ කරයි නම් හෙවත් මුසා බෙණෙයි නම් හෙතෙම පංචශීලයට අයත් සිව්වන ශික්ෂා පදය ඛණ්ඩනය කරන්නෙකි. සාමඤ්ඤඵල සූත්‍රයේ එන විවරණයට අනුව බෞද්ධයකු සතුවිය යුතු ලක්ෂණකි බොරුකීම දුරුලා බොරුකීමෙන් වැළකීම. ඇත්ත ප්‍රකාශ කිරීම. ඇත්තෙන් ඇත්ත ගලපා කීම. තහවුරු ව පිහිටි කථා කිරීම. ඇදහිය යුතු ඇදහිය හැකි කථා ඇත්තේකු වීම. ලොව නොරවටන්නෙකු වීම.[12]

මුසාවාදා වේරමණී යන ද්විපදයෙන් අර්ථවත් වන බොරුකීමෙන් වැළකීම නම් වූ ශික්ෂාපදය බෞද්ධ සදාචාරාත්මක නිර්ණායක සමඟ විමසිය යුතුය. ඒ සඳහා ප්‍රමාණවත් සූත්‍ර රාශියකින් පෙළ දහම පරිපූර්ණය. විශේෂයෙන් ම මේ සඳහා උපයෝගී කර ගත හැකි සූත්‍ර තුනකි. එනම්, කාලාම සූත්‍රය,[13] ආධිපතෙය්‍ය සූත්‍රය[14] සහ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය[15] යි. කාලාම සූත්‍රයේ දී අප කරන ක්‍රියාවක්

1. කුසල ද අකුසල ද?
2. සාවද්‍යය ද අනවද්‍යය ද?
3. විඤ්ඤූපුරිසයන් විසින් ප්‍රසංසා කරත් ද නො කරත් ද?
4. හිතයට සුඛයට වැටෙත් ද නො වැටෙත් ද? [16]

යනුවෙන් ප්‍රශ්න කොට එය ලෝභය, ද්වේශය හෝ මෝහය පිණිස වන්නේ දැයි අප විසින් ම පරීක්ෂා කළ යුතු පෙන්වා දෙයි. ඒ අනුව, එය ලෝභය, ද්වේශය හෝ මෝහය පිණිස වන්නේ නම් අත්හළ යුතු බවත් එය අලෝභය, අද්වේශය හෝ අමෝහය පිණිස වන්නේ නම් අනුගමනය කළ යුතු බවත් පෙන්වා දෙයි.[17]

අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රයේ දී අප විසින් සිදු කළ හැකි ක්‍රියාවන් අතුරෙන් සිදු කළ යුත්තේ තමාටත් අනුන්ටත් දුක් පිණිස හේතු නොවන්නක් බව පෙන්වා දෙන[18] අතර තමාටත් අනුන්ටත් දුක් පිණිස හේතුවන ක්‍රියා සිදු නො කළ යුතු බව පෙන්වා දෙයි.[19]

මේ පිළිබඳ අදහස් දක්වන ඩබ්. ඩී. වීරරත්න මහතා පෙන්වා දෙන්නේ මිනිසා විසින් සිදු කළ හැකි ක්‍රියා හතක් ඇති බවයි.[20]

1. තමාට දුක් පිණිස හේතුවන නමුත් අන් අයට සැප පිණිස හේතුවන ක්‍රියාව අයහපත් ක්‍රියාවකි.

2. තමාට සැප පිණිස හේතුවන නමුත් අන් අයට දුක් පිණිස හේතුවන ක්‍රියාව අයහපත් ක්‍රියාවකි.
3. තමාටත් අන් අයටත් දුක් පිණිස හේතුවන ක්‍රියාව අයහපත් ක්‍රියාවකි.
4. තමාට සැප පිණිස හේතුවන නමුත් අන් අයට සැප හෝ දුක් පිණිස හේතු නොවන ක්‍රියාව යහපත් ක්‍රියාවකි.
5. තමාට සැප පිණිස හෝ දුක් පිණිස හේතු නොවන නමුත් අන් අයට යහපත පිණිස හේතුවන ක්‍රියාව යහපත් ක්‍රියාවකි.
6. තමාටත් අනුන්ටත් සැප පිණිස හේතුවන ක්‍රියාව යහපත් ක්‍රියාවකි.
7. තමාටත් අනුන්ටත් සැප හෝ දුක් පිණිස හේතු නොවන ක්‍රියාව යහපත් හෝ අයහපත් ක්‍රියාවක් නොවෙයි.

මෙම විස්තරාත්මක ක්‍රියා පටිපාටියට අනුව වීරරත්න මහතා මුහුණ දෙන ගැටලුව නම් යම් ක්‍රියාවක් සිදු කිරීමේ දී තමාට හෝ අනුන්ට හෝ තමාටත් අනුන්ටත් යන දෙපාර්ශවයට ම හෝ දුක් පිණිස හේතු වුව ද එහි අවසාන ප්‍රතිඵලය සැප පිණිස හේතු වේ නම් එවන් අවස්ථාවන්හි දී අප කෙසේ කටයුතු කළ යුතු ද යන්නයි.[21] මෙවැනි සිදුවීම් පෙන්වා දීම සඳහා බුද්ධ චරිතය හා සම්බන්ධ සිදුවීම් පිළිබඳව සමාලෝචනයක ද එතුමා යෙදෙයි. කිසාගෝතමිය තම දරුවා මළ බව නොදන ඔහු සුවපත් කර දෙන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටි විට බුදුරජාණන් වහන්සේ ඔහු සුවපත් කර දීමට නම් කිසිවකු නො මළ ගෙයකින් අබ ස්වල්පයක් රැගෙන එන ලෙස සිදු කළ ප්‍රකාශය එතුමන් විසින් යොදා ගත් එක් ප්‍රස්තුතයකි. බුදුන්වහන්සේගේ පිළිතුරත් සමග ඇය ප්‍රථමයෙන් මුලා වු අතර පසුව සත්‍යය වටහා ගත්තා ය. ඒ අනුව මේ කතා පුවතින් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ සත්‍ය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි බවකි.

අපගේ ප්‍රස්තුතයට අනුව මුසාවාදයක් වන්නේ කුමක් දැයි හඳුනාගත යුතුය. මේ පිළිබඳව ඉතා පැහැදිලි විස්තරයක් චුන්ද සූත්‍රයේ දී හමුවේ.[22] එනම්:

1. නො දන්නේ දනිමියි කිය යි.
2. දන්නේ නො දනිමියි කිය යි.
3. නො දක්නේ දකිමියි කිය යි.
4. දක්නේ නො දකිමියි කියි යි.

වසල සූත්‍රයේ දී යම් පුද්ගලයෙක් තමා හේතු කොට ගෙන හෝ, වෙනත් අයෙකු හේතු කොට ගෙන හෝ, ධනය හේතු කොට ගෙන හෝ සත්‍ය විචාරණ විට අසත්‍ය ප්‍රකාශ සිදු කරයි නම් හෙතෙම වසලයකු වන බව දක්වා ඇත.[23] එසේ ම ධම්මික සූත්‍රයේ දී යමෙක් සභාවක දී හෝ පිරිසක් මධ්‍යයේ දී හෝ තනිව සිටි අවස්ථාවක දී හෝ තවත් අයෙකුට අසත්‍ය ප්‍රකාශ නොකළ යුතු බවත්, වෙනත් අයකු ලවා සිදු නොකළ යුතු බවත්, යමෙක් අසත්‍ය ප්‍රකාශ කරන්නේ නම් ඒ සඳහා සහයෝගය ලබා නොදිය යුතු බවත්, අසත්‍යය සම්පූර්ණයෙන් ම දුරු කළ යුතු බව දක්වා ඇත.[24] මෙම කරුණු සළකා බැලීමේ දී පැහැදිලි වන්නේ අසත්‍ය ප්‍රකාශ කිරීම සඳහා කිසිදු ඉඩක් බුදු දහම තුළ නොමැති බවයි.

බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂත්වය විස්තර කිරීමේ දී ''ශ්‍රමණ තෙමේ බොරු කීම දුරැලා, බොරු කීමෙන් වැළැක්කේ ය. ඇත්ත කියන්නේ ය. ඇත්තෙන් ඇත්ත ගළපා කියන්නේ ය. තහවුරු වැ පිහිටි කථා ඇත්තේ ය. ඇදහියැ යුතු කථා ඇත්තේ ය. ලොවැ නො රවටන්නෙකැ''යි දක්වා ඇත.[25]

ඒ අනුව, ධර්මය දේශනා කිරීමේ දී බුදුරජාණන් වහන්සේ විසින් අනුගමනය කරන ලද ක්‍රියා මාර්ග පිළිබඳ අපගේ අවධානය යොමු විය යුතුය. අභයරාජකුමාර සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නයකි, ''ඔබ වහන්සේ යම් වචනයක් අන් අයට අප්‍රිය ද අමනාපද එය ප්‍රකාශ කරන්නේ ද?'' යන්න. ඒ සඳහා උන්වහන්සේගේ පිළිතුරු වූයේ, ''රාජ කුමාරය, එහි ඒකාන්ත නිශ්චයක් නැතැයි'' යන්න. එම පිළිතුර විවිරණය කරමින් බුදුරජාණන් වහන්සේ මෙසේ පැහැදිලි කරති, ''රාජ කුමාරය, මම යම් වචනයක් අසත්‍ය ද අවැඩදායක ද ඒ වචනය අනුන්ට අප්‍රිය ද, අමනාප ද එය නො කියමි. යම් වචනයක් සත්‍යය ද, වැඩදායක ද අප්‍රිය අමනාප වුවත් මම එය කියමි. යම් වචනයක් සත්‍ය ද, වැඩදායක ද, අනුන්ට ප්‍රිය ද, මනාප ද එය කියමි.''[26] මේ අනුව, යම් ප්‍රකාශයක් යමෙකුගේ යහපත පිණිස පවතී නම් එය අසන්නාගේ නොසතුටට හේතු වුව ද අවස්ථාවෝචිතව එය ප්‍රකාශ කළ යුතු බවයි.

මේ බව වඩාත් හොඳින් පැහැදිලි කෙරෙන සූත්‍ර දේශනාවකි වස්සකාර සූත්‍රය. එහි දී බුදුරජාණන් වහන්සේ වස්සකාර බමුණා අමතා මෙසේ දේශනා කරයි.

> ''බමුණ, මම දුටු ඇසූ විඳින ලද හා දන්නා ලද හැමදේ ම නො කිව යුතු යැයි නො කියමි. කිව යුතු යැයිද නො කියමි. බමුණ දුටුයමක්, ඇසූ යමක්, විඳින ලද යමක්, දන්නා ලද යමක් කියන්නාට අකුශල ධර්ම වැඩෙයි නම් කුශල ධර්ම පිරිහෙයි නම් එබඳු ඇසූදුටු විඳි හා දත් දේ කිව යුතු යයි නො කියමි. බමුණ දුටු යමක් ඇසූ යමක් විඳියමක් හෝ දත් යමක් කියන්නාට කුශල ධර්ම වැඩෙයි නම් අකුශල ධර්ම පිරිහෙයි නම් එබඳු ඇසූ දුටු හෝ දත් දෙය කිව යුතු යයි මම කියමි.''

මේ අනුව, යමක් සත්‍ය වූ පමණින් එය ප්‍රකාශ කළ නොහැකිය. එම ප්‍රකාශය මුල් හේතු කොට ගෙන ඇතිවය හැකි ප්‍රතිඵලය පිළිබඳව ද ප්‍රකාශකයාගේ අවධානය යොමු විය යුතු ය.

උක්ත කරුණු සියල්ල පිළිබඳව අවධානය යොමු කළ විට ඒ බව වඩාත් හොඳින් තහවුරු කිරීම සඳහා සාලෙය්‍යක සූත්‍රයේ එය විස්තරය විමසා බැලිය යුතුය. එහි දී යම් ගෘහපතියෙක් සභාවකට හෝ සමූහයක් ඉදිරියට හෝ ඥාති පිරිසක් ඉදිරියට හෝ සේනාවක් ඉදිරියට හෝ රාජකුලයක් ඉදිරියට හෝ ගිය අවස්ථාවකදී සත්‍ය ප්‍රකාශ කරන්න යැයි ඉල්ලා සිටි විට, යමක් දනී නම් එය ප්‍රකාශ කළ යුතුය, යමක් නොදන්නේ නම් එය නොදන්නේ යැයි ප්‍රකාශ කළ යුතුය, යමක් නොදක්කේ නම් එය නොදක්කේ යැයි ප්‍රකාශ කළ යුතුය, යමක් දක්කේ නම් එය දක්කේ යැයි ප්‍රකාශ කළ යුතුය, තමා හේතු වෙන් හෝ අනුන් හේතුවෙන් හෝ ලාභ හේතුවෙන් හෝ දැන දැන බොරු නොකිව යුතු ය. යමක් සත්‍ය වුව ද ඔවුනොවුන් බිඳවනු සඳහා හේතු වන යමක් වේ නම් එය නොකිව යුතු ය. අසමඟි වූ දෙයහළුවන් සමඟි කිරීම සඳහා, පවතින සමඟිය වැඩි කිරීම සඳහා යමක් හේතු වෙත් ද එය ප්‍රකාශ කළ යුතු ය. කනට මිහිරි, බොහෝ දෙනාට ප්‍රිය වූ යම් ප්‍රකාශක් වේද එය කිව යුතු ය. කල් යල් බලා ප්‍රකාශ කළ යුත්ත, අරුත් සහිතව ප්‍රකාශ කළ යුතු ය.[27]

උක්ත කරුණු අනුව, යමෙක් මුසාවාදයෙන් වැළකීම සඳහාත් කළ වරදින් මිදීම සඳහාත් අනුගමනය කළ යුතු පියවර හතරක් සංබධම සූත්‍රයෙහි දක්වා ඇත.[28]

1. තමා විසින් බොරුවක් ප්‍රකාශ කළේ යැයි එය පිළිගැනීම.
2. තමා විසින් යම් ඒ පමණ වූ යම් මුසාවක් ප්‍රකාශකරන ලද්දේ වේ නම් එය යහපත් ක්‍රියාවක් නො වන බව වටහා ගැනීම.
3. තමන් ඒ හේතුවෙන් කණගාටු විය යුතු අතර නුවණින් සලකා එම මුසාවාදය දුරු කිරීම.
4. මතු ද මුසාවායෙන් වැළකෙමියි අධිෂ්ඨාන කිරීම.

මෙසේ මේ පව්කම් ප්‍රහාණය වෙයි. මෙසේ මේ පව්කම් ඉක්මවීම වෙයි. අනෙකුත් ශික්‍ෂාපද මෙන් ම මුසාවාදය ද පියවර තුනක් ඔස්සේ අනුගමනය කළ යුතු බව ධම්මික සූත්‍රයේ සඳහන් වේ.[29]

1. තමා බොරු කීමෙන් වැළකීම
2. අනුන් ලවා බොරු කියවීමෙන් වැළකීම
3. අනුන් බොරු කියන විට ඊට අනුබල නො දීම හා විරුද්ධ වීම.

මෙයින් පැහැදිලි වන්නේ වීරරත්න මහතා විසින් ඉදිරිපත් කරන කරුණ බුදුදහමේ දී ඇගයීමට ලක් ව ඇති බවයි. මෙවන් අවස්ථාවන් හි දී යොදා ගත යුතු නිර්ණායක අධිපතෙය්‍ය සූත්‍රයේ සඳහන් වේ.[30]

1. තමාගේ අරමුණ පිළිබඳව නුවණින් මෙනෙහි කිරිම
2. තමාට වඩා ආධ්‍යාත්මක ගුණයෙන් උසස් අයගේ අදහස් පිළිබඳව නුවණින් මෙනෙහි කිරීම.
3. තමාගේ අභිමතාර්ථය ඉෂ්ටකර ගැනීම සඳහා ධර්මයෙහි උපයෝගීතාව පිළිබඳ මෙනෙහි කිරීම.

සුවිශේෂී කුසල කර්මයක් සිදුකිරීම සඳහා අප ක්‍රියාත්මක වීමේ දී හෙවත් යම් ප්‍රකාශයක් කිරීමේ දී මෙම පියවර අපට අනුගමනය කළ හැකිය. නිබ්බෙධික සූත්‍රයෙහි එන ''චේතනාව කර්මය බවත් සිතින් සිතා කයින්, වචනයෙන් හා මනසින් ක්‍රියා සිදු කරන බව''[31] සඳහනට අනුව අප සිදු කරන්නේ යහපත් හෝ අයහපත් ක්‍රියාවක් දැයි වඩාත් හොඳින් වටහා ගත හැකිය. අප කයෙන් සිදු කරන ක්‍රියාව, වචනයෙන් ප්‍රකාශ කරන දෙය හෝ මනසින් සිතන දෙය ඇතැම් විට එය ආරම්භයේ දී තමාට හෝ අනුන්ට හෝ දෙපාර්ශවයට ම හෝ දුක් පිණිස පැවතිය ද එහි අවසන් ප්‍රතිඵලය යහපත් වේ නම් එවැනි දෑ සිදු කිරීමට කටයුතු කළ යුතු බව උක්ත කරුණු අනුව පැහැදිලි වේ.

ඒ අනුව, අප ප්‍රස්තුතය වන, 'අප විසින් දකින ලද අසන ලද විඳින ලද හා දැනගන්නා ලද යමක් වේ නම්, එය ප්‍රකාශ නොකිරීම බොරුවක් යැයි සැළකිය හැකි ද' යන්නට පිළිතුර වස්සකාර සූත්‍රයේ දී ලබා දී ඇති බව ඉහතින් දක්වන ලදි.

---

[1] ඒතං හි බෝ පොට්ඨපාද අත්ථසංහිතං ඒතං ධම්මසංහිතං ඒතං ආදිබ්‍රහ්මචරියකං. ඒතං නිබ්බිදාය විරාගාය නිරෝධාය උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. තස්මා ඒතං මයා බ්‍යාකතන්ති.
පොට්ඨපාද සූත්‍රය, දී.නි.1 පිට. 414

[2] දී.නි. 3. අග්ගඤ්ඤ සූත්‍රය, පිට. 150-6

[3] දී.නි. 3. චක්කවත්තිසීහනාද සූත්‍රය, 116-8 පිටු.

[4] දී.නි. 3. අග්ගඤ්ඤ සූත්‍රය, 150-6 පිටු.

[5] ද්වෙපානන්ද වෙදනා වුත්තා මයා පරියායෙන, තිස්සොපි ... පඤ්චපි ... ඡපි ... අට්ඨාරසපි ... ඡත්තිංසාපි ... අට්ඨසතම්පි වෙදනා වුත්තා මයා පරියායෙන ...
ම.නි. 2. පහපති වගග, බහුවේදනිය සුත්ත. 102 පිටුව.

[6] ජිගච්ඡා පරමා රොගා - දරුණුම රෝගය කුසගින්නය
ධම්ම පදය - 203 ගාථාව.

[7] උට්ඨානවිරියාධිගතා, බාහාබල පරිචිතා, සෙදා වක්ඛිත්තා
අ.නි. 1. අණන සූත්‍රය. 168 පිටුව.

[8] එවං ඛො හනෙත නිගණේඨා නාතපුතෙතා සාවකානං ධමමං දෙසෙතිඃ යො කොචි ... මුසා භණති සබේබා සො ආපායිකො නෙරයිකො. යො බහුලං යං බහුලං විහරති තෙන තෙන නියාතීති.
ස. නි. 4. සළායතන වග්ග, ගාමිණී සංයුත්ත, සංඛධම සුත්ත, බුජමු. 576 පිටුව.

[9] යං බහුලං යං බහුංඤ්ච ගාමිණී විහරති තෙන තෙන නීයාතීති එවං සනෙත න කොචි ආපායිකො නෙරයිකො හවිස්සති යථා නිගණ්ඨස්ස නාතපුත්තස්ස වචනං තං කිම්මඤ්ඤසි ගාමිණි යො සො පුරිසො ... මුසාවාදී රත්තියා වා දිවසස්ස වා සමයාසමයං උපාදාය කතමො බහුතරො සමයො යං වා සො මුසා භණති යං වා සො මුසා න භණතීති. යො සො හනෙත පුරිසො මුසාවදී රත්තියා වා දිවසස්ස වා සමයාසමයං උපාදාය අප්පතරො සො සමයො යං සො මුසා භණති. අථ ඛො සොච බහුතරො සමයො යං සො මුසා න භණතීති. යං බහුලං යං බහුලඤ්ච ගාමිණී විහරති තෙන තෙන නීයාතීති එවං සනෙත න කොචි ආපායිකො නෙරයිකො හවිස්සති යථා නිගණ්ඨස්ස නාතපුත්තස්ස වචනං.
ස. නි. 4. සළායතන වග්ග, ගාමිණී සංයුත්ත, සංඛධම සුත්ත, බුජමු. 578 පිටුව.

[10] ඉධ ගාමිණි එකච්චො සත්ථා එවං වාදී හොති එවං දිට්ඨීඃ යො කොචි ... මුසා භණති සබේබා සො ආපායිකො නෙරයිකොති. තස්මිං ඛො පන ගාමිණී සත්ථරි සාවකො අභිප්පසනෙතා හොති, තස්ස එවං හොති මයහං ඛො සත්ථා එවං වාදි එවං දිට්ඨී පටිලභති. තං ගාමිණී වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.
ස. නි. 4. සළායතන වග්ග, ගාමිණී සංයුත්ත, සංඛධම සුත්ත, බුජමු. 578 පිටුව.

[11] පඤ්ච ගහපති, පහයානි වෙරානි අප්පහාය 'දුස්සීලො' ඉති වුච්චති, නිරයං ච උපපජ්ජති, කතමානි පඤ්ච? පාණාතිපාතං, අදින්නාදානං, කාමෙසුමිච්ඡාචාරං, මුසාවාදං, සුරාමෙරයමජ්ජපමාදට්ඨානං
අ.නි. 3. පඤ්චකනිපාතය, උපාසක වග්ග, වෙර සුත්ත, බුජමු. 332 පිටුව.

[12] මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතෝ හෝති සච්චවාදී සච්චසන්ධෝ ථේතෝ පච්චයිකෝ අවිසංවාදකෝ ලෝකස්ස.
දී.නි. 1, සාමඤ්ඤඵල සූත්‍රය, 110 පිටුව.

[13] අ.නි. 1, කාලාම සූත්‍රය, බුජමු. 336 පිටුව.

[14] අ. නි. 1. තික නිපාත, දේවදූතවග්ගය, ආධිපතෙය්‍ය සූත්‍රය. බුජමු. 268 පිටුව.

[15] ම. නි. 2, අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රය, 132 පිටුව.

[16] ඉමෙ ධම්මා කුසලා වා අකුසලා වා ති? ඉමෙ ධම්මා සාවජ්ජා වා අනවජ්ජා වා ති? ඉමෙ ධම්මා විඤ්ඤූගරහිතා වා විඤ්ඤූපසත්ථා වා ති? ඉමෙ ධම්මා සමත්තා සමාදිම්මනනා හිතාය සුඛාය නො වා කථං වා හෙත්ථ හොතී ති?
අ.නි. 1, කාලාම සූත්‍රය 336 - 344 පිටු.

[17] යදා තුමෙහ කාලාම අත්තනාව ජානෙය්‍යාථ,
අ.නි. 1, කාලාම සූත්‍රය 342 පිටුව.

[18] ඉදං මෙ කායකම්මං නෙවත්තව්‍යාබාධායපි සංවත්තති, න පරව්‍යාපාධායපි සංවත්තති, න උභයව්‍යාබාධායපි ixj;;;s"
කුසලං ඉදං කායකම්මං සුඛුද්‍රයං සුඛවිපාකනති.
ම. නි. 2. අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රය, 134 පිටුව.

[19] ඉදං මෙ කායකම්මං අත්තව්‍යාබාධායපි සංවත්තති, පරව්‍යාපාධායපි සංවත්තති, උභයව්‍යාබාධායපි සංවත්තති, අකුසලං ඉදං කායකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකනති.
ම. නි. 2. අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රය, 134 පිටුව.

[20] Individual and society in Buddhism, W.G. Weeratne, Colombo, 1977, p. 41

[21] එම.

[22] ඉධ චුන්ද එකච්චො මුසාවාදී හොති සභාගතො වා පරිසගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො ''එහම්භො පුරිස යං ජානාසි තං වදෙහී'ති'. සො අජානං වා ආහ 'ජානාමී'ති, ජානං වා ආහ 'න ජානාමී'ති අපස්සං 'වා ආහ 'පස්සාමී'ති. පස්සං වා ආහ 'න පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසිතා හොති,
අ. නි. 6. දසක නිපාත, චුන්ද සූත්‍රය, බුජමු. 484 පිටුව.

[23] යෝ අත්තහේතු පරහේතු ධනහේතු ච යෝ නරෝ - සක්ඛීපුට්ඨෝ මුසා බෲතී තං ජඤ්ඤා වසලෝ ඉති.
සු.නි. 122 ගාථාව. 38 පිටුව.

[24] සභග්ගතෝ වා පරිසග්ගතෝ වා - ඒකස්ස චේකෝ න මුසා භණෙය්‍ය,
න භාණයේ භණතං නානුජඤ්ඤා - සබ්බං අභූතං පරිවජ්ජයෙය්‍ය.
සු.නි. 399 ගාථාව 118 පිටුව.

[25] මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො සමණො ගොතමො සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්සා'ති.
දී.නි. 1. 6. ලක්ඛණ සූත්‍රය,/ පාටිකවග්ග පාලි, 3. 170/ මූලපණ්ණාසක පාලි, ඕපම්ම වග්ග, චූල හත්ථිපදොපම සුත්ත. 1. 179/ මජ්ඣිමපණ්ණාසක පාලි, ගහපති වග්ග, කන්දරක සුත්ත 1. 345/ උපරිපණ්ණාසකපාලි, දෙවදහවග්ග, දෙවදහ සුත්ත, 2, 226/ උපරිපණ්ණාසකපාලි, අනුපද වග්ග, 3, 33/ 48.

[26] ම.නි. 2, අභයරාජකුමාර සූත්‍රය, 96, පිටුව.

[27] ම.නි. 1, සාලෙය්‍යක සූත්‍රය, 668 පිටුව.

[28] භගවා ඛො අනෙකපරියායෙන මුසාවාදං ගරහති විගරහති, මුසාවාදා විරමථාති චාහ. අත්ථි ඛො පන මයා මුසා භණිතං යාවතකං වා තාවතකං වා, යං ඛො පන මයා මුසා භණිතං යාවතකං වා තාවතකං වා, යං ඛො පන මයා මුසා භණිතං යාවතකං වා තාවතකං වා, තං න සුට්ඨු, තං න සාධු. අහඤ්චෙව ඛො පන තප්පච්චයා විප්පටිසාරී අස්සං න මෙ තං පාපකං කම්මං අකතං භවිස්සතීති. සො ඉති පටිසඞ්ඛාය තඤ්චෙව මුසාවාදං පජහති, ආයතිඤ්ච මුසාවාදා පටිවිරතො හොති. එවමෙතස්ස පාපකස්ස කම්මස්ස පහානං හොති, එවමෙතස්ස පාපස්ස කම්මස්ස සමතික්කමො හොති.
ස. නි. 4. සළායතන වග්ග, ගාමිණී සංයුත්ත, සංඛධම සුත්ත. 583 පිටුව.

[29] සභග්ගතොවා පරිසග්ගතො වා - එකස්ස එකො න මුසා භණෙය්‍ය
න භාණයෙ භණතං නානුජඤ්ඤා - සබ්බං අභූතං පරිවජ්ජයෙය්‍ය
සුත්ත නිපාතය, ධම්මික සූත්‍රය, ගාථා 399,

[30] තීණි'මානි භික්ඛවෙ ආධිපතෙය්‍යානි. කතමානි තීණිඃ අත්තාධිපතෙය්‍යං, ලොකාධිපතෙය්‍යං, ධම්මාධිපතෙය්‍යං.
අ. නි. 1. තික නිපාත, දේවදූතවග්ගය, ආධිපතෙය්‍ය සූත්‍රය, 268 පිටුව.

[31] චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි, චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මානසා.
අ.නි. 4. ජක්කනිපාතය, දුතිය පණ්ණාසකය, මහා වගගය, 208 පිටුව.